# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය
(නව නිර්දේශය)

**සංස්කෘත සාහිත්‍ය විචාරයේ විකාසය LTCR 28224**

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඖචිත්‍ය වාදය හා වක්‍රෝක්ති වාදය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පහත පද්‍ය පංතිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

රන් යහනේ සැතපෙන කල බිසවුන් ට
රන් මාලාවක් තිබුණා එහි යහන පි ට
රන් දම් විගස දමුවා දෙවියෝ කර ට
අලුයම් වේලෙ ඔය සීනේ පෙනුනි ම ට

මහ සෙන් රැස්ව කුඩ කොඩි ගෙන වටකර ට
අහ සින් ඇවිත් රන් තරුවක් දෙරණ පි ට
විගසින් ඇහිඳ ගත්තෙමි අමයුරු ලෙස ට
සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළ ට

මහමායා සැතපෙන කල මල් යහ නේ
මහමෙර මුදුනෙ ආසනයක වැඩ ඉඳි නේ
අසල ගමක පුන්සඳ පිරිමඳිමින් නේ
මහ රජුනේ මොකදැ'යි ඔය දුටු සී නේ

රිදී යහන සැතපෙන කල බිසවුන් ට
පිරී දෙතන කිරි එරී කරඩුව ට
රිදී කඳකි නයි පැටියෙකි දෙරණ ව ට
නැරිය දරු සීන පෙනුණා බිසවුන් ට

02. පෙරදිග කාව්‍ය විචාර සිද්ධාන්තයෙහි ප්‍රභවය හා විකාසය පිළිබඳ විමසීමක් කරන්න.

03. ධ්වනි වාදය පිළිබඳ න්‍යායාත්මක හැඳින්වීමක් කරන්න.

04. 'භාරතීය විචාර වාද අතර ඖචිත්‍ය වාදයට වැදගත් ස්ථානයක් හිමි වෙයි.' සාකච්ඡා කරන්න.

05. වක්‍රෝක්ති වාදයේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

06. කාව්‍ය විචාරයෙහි ලා ගුණ - රීති වාදයේ අදාළත්වය නිදසුන් ඇසුරින් විමසන්න.

07. නූතන සිංහල කාව්‍ය විචාරයෙහි ලා වක්‍රෝක්ති වාදයෙන් ලැබෙන පිටුබලය කෙබඳු දැයි නිදසුන් ඇසුරින් පහදන්න.

08. සැළලිහිණි සංදේශය විචාරයට ලක් කිරීමේ දී ධ්වනි වාදය උපස්ථම්භක කර ගත හැකි ආකාරය සනිදර්ශනව විමසන්න.

09. බටහිර රොමැන්ටික් කාව්‍යාභාසයෙන් රචිත සුදෝසුදු කාව්‍ය ග්‍රන්ථය ඖචිත්‍ය විචාර සිද්ධාන්තය ඇසුරින් පැහැදිලි කරන්න.

*********************************